

ආචාර්ය රෝහණ වීරසිංහ
මධුර මියැසි රටාවන්ගෙන්
ආදරණීයයි නම්
සිසිර දිසානායක ගේය පදරචනා
LYRICS BY SISIRA DISSANAYAKE




ආචාර්ය රෝහණ වීරසිංහ මධුර මියැසි රටාවන්ගෙන්

# ආදරණීයයි නම්

සිසිර දිසානායක ගේය පදරචනා



## 1. සඳුන් අරණ

සඳුන් අරණ - සිසිල සඳන
සදෙව් විමන - සුවඳ හමන
සාර දෙරණ
වීර පොරණ - මාතෘ භූමියයි
අප උදාර වූ
ශ්‍රී ලංකා භූමියයි

මිනිස්කමේ සඳුන් සිසිල දසත ගලා යේ
දහම් බිමේ සුපිපි පද්ම සුවඳ හමා යේ
ආනන්දනීයයි.....
සිතුවම්, කැටයම්, වන්නම්, ගී.....
දළදාවේ හේවිසියේ
සීගිරි ගී තනු ගැන්වී
සඳා ගැයෙන උදානයයි මේ....!

දෙවන් මිණෙන් පෑදි දියෙනි පවස නිවූයේ
සාර පසින් සෑදි පළිනි රුහිරු ඉනූයේ
ආවර්ජනීයයි.....
පැරකුම්, දාසෙන්, වළගම්බා...
හිරු සඳු සේ කොත් නැංවූ
සත් සිඳු සේ වැව් බැන්දූ
ප්‍රෞඪ වීර පුරාවතයි මේ......!

**ගායනය :**
**ආචාර්ය වික්ටර් රත්නායක සහ පිරිස**

## 2. හිත වටේට

හිත වටේට හීන බැඳන්
කොහේ දුවනවා ද මන්ද මං ?
හිත අහන්නේ ම නෑ
කීවට අහන්නේ ම නෑ ....

එක තැනක ඉන්න
නිස්කාන්සුවේ
හිත් නො දෙන්නේ ඇයි - හිත මගේ ?
හිතන් නැතිව ඔහේ ඉන්න
මට හිතක් නැතිව ඉන්න තියේනම් ?

මට කඳුළු දෙන්න
නිස්කාරනේ....
දුක් ගෙනෙන්නෙ ඇයි - හිත මගේ ?
දැනෙන් නැතිව ඔහේ ඉන්න
දැන ගන්නෙ නැතිව ඉන්න තියේනම් ?

**ගායනය :**
**විශාරද දීපිකා ප්‍රියදර්ශනී**

## 3. අක් වැහි

අක්වැහි මානෙක නෑ
ඉඩැල්ල අහවර නෑ
දියකැටපහනේ කානාකාරිය
උංඩිය රාළේ - නැද්ද කනේ?

පෑයූ හේනේ කඩමුලන්
බලා හිඳී අනුකම්පාවෙන්
කැතිපයිගාවත් නැති අව් පුටකයේ
මහ රුක් වැටෙනා ලතෝනියෙන්
ඇගිරි ගාති වන රුක් දෙව්යෝ

වෑ තාවල්ලේ දැව වැද්දන්
පොරෝ ගායි දෙවනත් කරමින්
අඬුකඳයාවත් නැති බද්දේ රාළේ
දැව එක් කරලා නෑසු වනෙන්
හුන්නාකඩ නුඹෙ සෑය බඳිමි

**ගායනය : විශාරද අමරසිරි පීරිස්**

**අරුත :**

අක්වැස්සක් පේන තෙක් මානයක නැත. ඉඩෝරය අවසන් නැත. සිඳී ගිය වැවේ දිය මනින දියකැටපහන කරනා කන්නලව්ව කපුරාළට ඇසෙන්නේ නැතිද ? එළි කර ගිනි තැබූ හේනේ ඉතිරි ලී, මුල් කැබලි අප දෙස බලන්නේ අනුකම්පාවෙන්. වැසි නැතිව කැත්තෙන් කැපිය හැකි ගසක්වත් නැති අව්වේ ඇසෙන්නේ මහා ගස් ඇද හැලෙන ලතෝනියෙන් මුර ගාන වන රුක් දෙවියන්ගේ හඬයි.

වැවට ජලය සපයන ප්‍රදේශයේ පවා ගස් කපන්නන්ගේ පොරෝ හඬින් වනය දෙවනත් වෙයි. දැඬුවම් පැමිණවීමට දඬු කඳක්වත් නැති නීති කරවන්නනි, නුඹලාගේ අනුදැනුමින් විනාශ වුණ කැලයෙන් දඬු එකතු කර වැව් බැම්මේ මැද නුඹලාගේ සෑය බඳිමි.

අක්වැස්ස -
ඉඩෝරයකට පසු වසිනා මුල් වැස්ස
ඉඩැල්ල - ඉඩෝරය
අහවර - අවසන්
දියකැටපහන - වැවක ජල මට්ටම
මැණීමට සිටවන කණුව
කානාකාරිය - යාදින්න, කන්නලව්ව
උංඩිය රාළ - කපුරාළ
කඩමුලන් - ගිනි තැබූ හේනක ඉතිරි ලී
කැබලි, මුල් කැබලි
කැතිපයිගා - කැත්තෙන් කැපිය හැකි ගස්
ඇගිරි ගානවා - යටිගිරියෙන් කෑගසනවා
වෑ තාවල්ල - වැවට ජලය සැපයෙන ප්‍රදේශය
දැව වැද්දන් - සොරෙන් දැව කපන්නන්
පොරෝ ගානවා - පොරවෙන් කපනවා

**7. ආශාවරියේ**

ආශාවරියේ
නො ගැයුණ ගීයකි
*ප්‍රේමාලාපේ - අපේ
රාමායණයේ
නො ලියුණ පුවතකි
*ප්‍රේමාතීතේ - අපේ
අරුතක් නෑ - එක තනුවක් නෑ
අප *ප්‍රේමායණයේ ... !

පදවැල් බඳිමින්
අරුත් මවන්නට
පන්හිඳ වෙහෙසමි මා....
රාමායණයේ රස හව් අතරේ
අන්ධව හිඳිනෙමි මා....

ස්වරයන් සොයමින්
හඬක් නඟන්නට
වෙණ තත් හඬවමි මා....
ආශාවරියේ සංගති අතරේ
බිහිරිව හිඳිනෙමි මා....

**ගායනය :**
**ආචාර්ය විශාරද නන්දා මාලිනී**

**ගීය වෙනුවෙන් නිර්මාණය වූ වචන**

* ප්‍රේමාලාපය - ප්‍රේම + ආලාපය
උත්තර භාරතීය සංගීතයේ රාගයක්
ගැයීමට පෙර "ආ" හඬින්
ගැයෙන්නේ ආලාපයයි.

* ප්‍රේමාතීතය - ප්‍රේම + අතීතය

* ප්‍රේමායණය -
රාමායණය වදනේ ශබ්ද
රසයම නැංවීමට

**8. මධු මල්**

මධු මල් පිපෙනා පෙම් උයනේ
මා තනි කරවා
පරසතු මල් පිපි දෙව් විමනේ
නුඹ ළතැවෙනවා
මධු මල් ඇතිරූ තනි යහනේ
මා නිදි කරවා
පර මල් විසිරුණු රන් සයනේ
නුඹ වැළපෙනවා....!

කුඩා වියේ ලෙන්ගතුකම් කෙළි ලොල්ලේ
යෞවනයේ පෙම්බරකම් කුළුඳුල්ලේ
ගෙවී වසන්තය ම
රන් නැකතින් නිමා වුණා දෝ ?
රන් දෝලාවක සැඟව ගියාදෝ ?

දෙතැන වුණත් යළි හමුවන පැතුම් එපා
අහිමි වුණත් මා වෙනුවෙන් හැඬුම් එපා
ගෙවී අතීතය ම
මගෙ තනියට ළඟ උන්නාවේ...!
ඒ පෙම් සැමරුම් මගෙ ම වුණාවේ...!

**ගායනය : ආචාර්ය වික්ටර් රත්නායක**
**තනුව : කැමරන් කොළඹගේ (මෙල්බර්න්)**
**සංගීතය : ආචාර්ය රෝහණ වීරසිංහ**
කැමරන් කොළඹගේ ශිල්පියා එළිදැක්වූ
"දස මස ඔබ මා" ගී එකතුවෙන්

**9. කරපිංචා කුරුපිංචී**

කරපිංචා කුරුපිංචී
බත් පිඟානෙ කොනක ඉඳන්
සුසුම් හෙළන්නී
කඳුළු සලන්නී

ව්‍යංජනේ රසකරන්න
ගුණ සාරය පුදලා
ඇතිලිය ඇතුලේ
වින්දා වූ දුක් කරදර
දැන් අමතක කරලා

සලාදයේ හැඩ බලන්න
කවුරුත් වහ වැටිලා
බත් පත මුදුනේ
රන්දාවී හැඩ වැඩ කර
රස ගුණ ගැන නොබලා

**ගායනය :**
**සරිනි දිසානායක (මෙල්බර්න්)**

"අතුරු මිතුරු" ළමා ගී එකතුවෙන්

**10. ඉසුරුමුණියක**

ඉසුරුමුණියක තියා මා
ඉසුරු පුරයක ගියා දෝ - නුඹ
පුද බිමකි අද ඉසුරුමුණිය ම
ආදරේ නාමෙන්...!

රළුව නැගි පව්වේ
නෙළාලා ආදර හැඟුම්
මං මුළා කර ගියේ ඇයි දෝ ?
ඉසුරුමුණියෙ ම පොකුණු පිරුණායි
මගේ උණු කඳුලින් .....!

නිහඬ මුණි අරණේ
මවාලා රන්මසු උයන්
මාව හැරදා ගියේ ඇයි දෝ
හද දවාලන සුසුම් කැළඹෙයි
තිසා වැව් සුළඟින්....!

**ගායනය :**
**විශාරද ජානක වික්‍රමසිංහ**

සින්ග්ලංකා සමාගම නිකුත් කළ
"ආදරයෙන් බලන්න" ගී එකතුවෙන්

**11. කෝණ පොජ්ජ**

කෝණ පොජ්ජ නේරනවා
ළා කැකුලෝ මෝරනවා
තඹ පෝරු කොදුයි
පින් පොජ්ජ කොදුයි
අකුරු පොජ්ජ හිත්ලනවා - කොදුයි

දෙටුපල්ලත්තන බුදිනා හූරා
කැලෑ පොජ්පේ මංගච්චන්නා
පුච්චා කඩලා - දඩමං නහනා
වන්නි පොජ්ජ මන්දෝ කරනා

කොළොම් පෝරුගම් පොජ්ජේ හූරා
අකුරු පොජ්ජ කරුකරුගච්චා
වන්නියලැත්තොගෙ වරිගය නහනා
හඳුන්පොතක් කොයි ? - කොදුයි, කොදුයි

**ගායනය :**
**විශාරද නෙලූ අධිකාරි**

**අර්ථය :**
පෝය ගෙවෙනවා, දරුවන් මෝරනවා. ඒත් ...කාසි නැහැ. පින් කරලා නැහැ. ඒ නිසා අකුරු ඉගෙන ගැනීමක් වෙන්නේ නෑ. බතින් යැපෙන මහත්වරු වනයට පැමිණ වෙඩි තියලා අපේ දඩයම්, දඩ මං නැති කරනවා. අපේ වන්නියත් අපට නැති කරනවා. කොළඹ ඉන්න මහත්වරු අකුරු ඉගෙනගෙන නීති හදලා වන්නියේ වසන අපේ වර්ගයා නැති කරනවා. හදවතක් (අනුකම්පාවක්) කොහෙද තියෙන්නේ? හදවතක් නෑ - නෑමයි.

**වැදි ජන වහරින් -**
කෝණ පොජ්ජ - පෝය/ සඳ
නේරනවා - හැංගෙනවා
පෝරු - කාසි
කොදුයි - නැහැ
හිත්ලනවා - හිතට ගන්නවා
දෙටුපල්ලත්තන - බත්/හාල්
මංගච්චනවා - යනවා/එනවා
ළා කැකුලෝ - දරුවෝ
පුච්චා කඩලා - වෙඩිතියලා
මන්දෝ කරනා - නැති කරනවා
හූරා - මහත්තයා
කොළොම් පොරුගම් පොජ්ජ - කොළඹ
කරුකරුගච්චා - ලියනවා / නීති දානවා
හඳුන්පොත - හදවත
කොයි - කොහේද ?

**12. ශාප නොකරමි**

ශාප නොකරමි ඉතින් කිසිදා
දුරස් වී යැයි ඔබ මගෙන්
පෙමින් මා විඳි නිරානන්දය
දුරස් වී යයි මා කෙරෙන්....!

ඉරි තලා ගිය හද තලාවේ
පිය නගා යයි ඔබේ මිරිවැඩි
බොල් හඬින් සිත පියලි බිඳෙනා
නො හිමි සුවයකි නුඹ ලබන්නේ.....!

සිත දවාලන යටගියාවේ
අවුලවාලම් මගේ සිතුවිලි
ලද දෙයින් මා නුඹේ ඇසුරේ
මගේ මතු දින එළිය වන්නේ...!

**ගායනය : කීර්ති පැස්කුවෙල්**
"ටොරානා" සමාගමෙන් එළිදැක්වූ
"කඳුල" ගී එකතුවෙන්

**අර්ථය** - වියළි ඉරි තැළුණු පොළව මතු පිට ඇවිදින විට ඒ වියළුන කොටස් (පියලි) නගන හඬ එකී ඇවිද යන්නාට මිහිරක් ගෙන දෙයි. එහෙත් එය පොළවට පීඩාවකි.
නිරානන්දය -
නිර් + ආනන්දය - ආනන්දයක් නැති

## 13. නෙරිය තියන්නේ

දුව : නෙරිය තියන්නේ ළමා සාරියේ
කොහොම ද අම්මේ කියන්නකෝ
යන්න දහම් පාසැල්
පමා වේවි අදනම් !

අම්මා: නෙරිය තියන්නේ මගේ ඔසරියේ
කොහොම ද කියලා බලන්නකෝ
යන්න දහම් පාසැල්
දුවේ මමත් එන්නම් !

දුව : ඇයි අද අම්මා පන්සල් එන්නේ ?
ළමයි පිරිලා විහාර ගේ ඇතුලේ
වඳින්න බෑ අද නම් !

අම්මා: වැන්දා වාගෙයි පින් අත් වෙනවා
දූල - පුතාලට දන්නා තරමින්
දහම් කියා දෙන්නම්.

දුව : අම්මා දන්නා සින්දුත් කියමු
විවේකයේ දී - ළමයි ආස වේවි !
අත් පොළසන් දේවි !

අම්මා : වෙසක් ළඟයිනේ - බැති ගී ගයමු
දූල - පුතාලට සරම් මසන්නම්
නෙරිය තියා දෙන්නම්!

**ගායනය : ආචාර්ය විශාරද නන්දා මාලනී
සමඟ සරිනි දිසානායක** (මෙල්බර්න්)
"අතුරු මිතුරු" ළමා ගී එකතුවෙන්

## 14. ආදරණීයයි නම්

ආදරණීයයි නම්
ඔබට මා
ආදරණීය වුණේ
ඔබෙන් ම යි
ඔබේ ම ආදරයෙන් ......!

නිල් වන අරණක විල් කොඳ යායක
මල් පුබුදන්නට සිහිල දුන්නෙ ඔබ
මිහිදුම් සළුව එළා....
ආදරණීයයි මා
ඔබේ කෙවෙණි අග කඳුල නිසා .....!

ගොම්මන් අඳුරක මන්දාකිණියක
තරු ගවසන්නට එළිය දුන්නෙ ඔබ
අරුණැල් කිරණ විදා.....
ආදරණීයයි මා
ඔබේ දෙතොල් අග සිනහ නිසා....!

**ගායනය :**
**ආචාර්ය රෝහණ වීරසිංහ**

## 15. ආව ගියාවට

ආව ගියාවට කීව කතා
කන් දුන්නයි මං අන්ද වෙලා
ආව ගියානම් ආලෙ මවා
කැන්දන් යන්නට මන් ද පමා ?

මා ගැන අහලා බලන්ට එනවා
මෙ ගම් හතේ ඈයෝ
ඒ අය යවලා මට දෙස් දෙනවා
ඉතින් මගේ බෑයෝ...!

නුඹ ගැන කියලා - පද වපුරනවා
දොරින් දොරේ නෑයෝ
ඒ ගැන හිතලා හිත කකියනවා
අනේ මයේ දෙයියෝ ...!

**ගායනය :**
**නිරෝෂා විරාජිනී**
අර්ථ : බෑයෝ - සහෝදරයෝ

## 16. දැරිවියේ

දැරිවියේ
මේ කඳුලැල් වරුසා - සැමට ම යි !
නිදා නො නිඳන රෑ යාමේ
තුරුළු වෙයන් නුඹ නුඹේ ම තුරුළේ
වීදියෙ අගු පිල නෑ උණුසුම දෙන්නේ.....

තෙතබත් නුඹ දැක හිරිකඩ හීතේ
සිහිවෙනවා මට මගේ ම දෝණී
නුඹේ ම වයසේ - නුඹ වාගේ
ගලවා මගෙ වත පොරවා යන්නට
බැරි ඇයි දෝ සිතුණා - දැරිවියේ

මුසපත් රෑහින් හඬනා යාමේ
අයාලයේ මල් පිපේ ය රහසේ
අනේක වද වී - විස ගාලේ
නළවා කැකුලිය සනහාලන්නට
කවුරුන් දෝ ඉන්නේ - දැරිවියේ ?

**ගායනය :**
**සුනිල් එදිරිසිංහ**

**17. මැද්දේගම් ගිය**

මැද්දේගම් ගිය
මද්දුමයෝ - අද
බැද්දේගම් ගැන
නැද්ද වගක් ?

යානා නේනා මං වරදින්නා
නුඹැහෙට උළුවහු මදි ද පැළේ ?
අත අහවර දා වත් ඇයි මන්දා
නෑවිත් ඇරියේ බැද්දේගම් ?

අම්මා අප්පා පෝය ගනින්නා
හඳ පායන් නෑ අපට මලේ
අපි අසරණ දා ගම ගැන බලලා
බින්නේ බිඳේ දෝ මැද්දේගම් ?

**ගායනය :**
**විශාරද දීපිකා ප්‍රියදර්ශනී**

සින්ගලංකා සමාගමෙන් නිකුත් කළ
"මල් වරුසා" ගී එකතුවෙනි.

**18. වෙසක් බලන්ටා යමු**


මල්ලී : වෙසක් බලන්ටා යමු
කොළොම්පුරේ
අයියා : මලේ ඉතින් පරිස්සමින්
මතකද ගිය වාරේ?
කොළොම්පුරේ

මල්ලී : නේක හැඩේ කූඩු වගේ
ගෑණු ළමෝ දස අතේ
ඉසව් නිනව් නැතිව ගියා
කවට සිනා මුකුළුවේ
අයියා : වීදි පුරා මං සෙව්වා
රැය ගෙවුණායි දන්සැල් ගානේ...!

අයියා : "හෝ ගානා පොකුණ" වගේ
මහා සෙනඟ පිරිවරේ
මඩිස්සලෙත් දන් දුන්නා
තද බද වී පෙරහැරේ
මල්ලී : තොරණ පුරා තරු පෙනුණා
වෙසක් යසයි කොළොම්පුරවරේ...!

**ගායනය : බන්දුල විජේවීර (අයියා)**
**රොඩ්නි වර්ණකුල (මල්ලී)**

අර්ථ : "හෝ ගානා පොකුණ" - මුහුද



# LYRICS BY SISIRA DISSANAYAKE

**ස්තුතියි**

- ❖ **ස්වේච්ඡාවෙන් ගායනයට දායක වූ සියළු ශිල්පී ශිල්පිණීන්ට**
- ❖ **ගීත පිරිනැමූ :**

**සින්ග්ලංකා සමාගම - කුලරත්න ආරියවංශ**
මැද්දේගම් ගිය මද්දුමයෝ, හාද වෙන්ට ආව නමයි, ඉසුරුමුණියක තියා මා

**ටොරානා ආයතනය - සරත් කොතලාවල**
සස ලප නො පෙනේ, ශාප නො කරමි

**දෙරණ ආහාර පාන (ඕස්ට්‍රේලියාව) - ඩෙන්සිල් ජයවීර**
කරපිංචා කුරුපිංචි, නෙරිය තියන්නේ


**කැමරන් කොළඹගේ** - මධු මල් පිපෙනා

**අසුන්තා කරුණාරත්න** - උනා දමා

- ❖ **සංගීත පට සඳහා අනුග්‍රහය දැක්වූ :**

**ෆාහීම් මච්ජුඩ්**
දැරිවියේ, හිත වටේට හීන, ආව ගියාවට

**Luxel Blinds P/L - ගාමිණී කරවිදෙණිය**
සඳුන් අරණ,
ආශාවරියේ,
ආදරණීයයි නම්



**සිසිර දිසානායක -**
අක්වැහි,
කෝණ පොජ්ජ,
වෙසක් බලන්ටා

